**ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ආගමන හා විගමනදෙපාර්තමේන්තුවේ2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමනදෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි16දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජනවාරි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවලින් 2019දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමනදෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනයකළමතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම්ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් ලේඛනය වෙනුවෙන් විගණනයට ලබාදුන් පරිගණක මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනයේ (BOS Report) රු.377,752,173ක් වූ වර්ෂයේ ආරම්භක ශේෂයන් පෙන්නුම් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව සකස් කල යුතු වීම. | පරිගණක මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනයේ වර්ෂයේ ආරම්භක ශේෂයන් පහත පරිදි දක්වා ඇත.<br>නොනිමි වැඩ (9160)- 4,730,515,388<br>ඉඩම් (9153)– 66,945,000<br>ගොඩනැඟිලිඉදිකිරීම් (9151)-36,135,177<br>- 37,247<br>යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ(9152) -60,625,000<br>- 279,135,864 |
| (ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2018 වර්ෂයේ අවසන් ශේෂය 2019 වර්ෂය ආරම්භයේ සටහන් කිරීමේදී පෙර වර්ෂයේ විගණන විමසීම්වලට අනුගතව 2019 අගෝස්තු 05 දින මාරු පත්‍රයක් මගින් ගැලපීම් කර තිබුණද කේත අංක 9152 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය සටහන් කිරීමේදී රු.271,300ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේනිවැර දි වත්කම් වටිනාකම් ගිණුම්ගත කල යුතු වීම. | මාරු පත්‍රයේ අගය රු. 340,032,164 ක් ලෙස භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ ද භාණ්ඩාගාරය විසින් දෙපාර්තමේන්තු ශේෂ සමාන කිරීමට රු.271,300ක ගැලපීමක් සිදු කර ඇත. කෙසේ වුවත් 2019.12.31 දිනට දෙපාර්තමේන්තු හා භාණ්ඩාගාර ශේෂ (9152-යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ) රු. 376,270,173 ක් ලෙස සමාන වී ඇත. |

### 1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කේ්වල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.160,309,261 ක් වුවද දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.160,790,054ක් වූයෙන් එම ශේෂ දෙක අතර රු.480,793ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනසට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කල යුතු වීම. | 2019 වර්ෂයේකේවල ගිණුමේ ශේෂයපාලන ගිණුමේ ශේෂය අතර වෙනසක් නොමැත. එහෙත් විගණන විමසුමේ දක්වා ඇති වෙනසට හේතු වී ඇත්තේ පෙර වර්ෂයේ නොගැලපුන ශේෂයේ හා නැවත පරීක්ෂා කිරීමේදී හඳුනාගත් වෙනස්කම් මත පාලන ගිණුමට කරන ලද ගැලපුම්වේ. මෙම වෙනසට හේතු මේ වන විට හඳුනාගෙන ඇති අතර 2020 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත. |

**1.6.3 විගණන සාක්ෂි නොවීම**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බැරකම් පිළිබඳ ප්‍රකාශය (i)හි මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය අනුව බැඳීම් හා බැරකම් වටිනාකම ලෙස දක්වා තිබූ රු.2,114,031ක වටිනාකම් පිළිබඳ තහවුරු කරගැනීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිණි. | වටිනාකම් තහවුරු කර ගැනීමටඅදාල සාක්ෂි ඉදිරිපත් කල යුතු වීම. | රු. 9,893,851/- ක වටිනාකම් තහවුරු කර ගැනීමට අදාල සාක්ෂි වශයෙන් වූ අදාළ ගිවිසුම් හි පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි |
| (ආ) | මූල්‍යනොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ 2019 වර්ෂයේ මිලදී ගැනීම් වූ රු.100,508,249ක ශේෂය පරිගණක මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනයේ (BOS Report) හි පැහැදිලිව හඳුනා ගත නොහැකි වුණි. | 2019 වර්ෂයේ මිලදී ගැනීම් නිවැරදිව හඳුනාගත හැකි ආකාරයට සටහන් කල යුතු වීම. | දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාරය මඟින් ලබා දී ඇති උපදෙස් පරිදි පරිගණක මුද්‍රිත ස්ථාවර වත්කම් ලේඛනය (BOS Report) පවත්වාගෙන යන අතර, එහි 2019 වර්ෂයේ මිලදී ගැනීම් සියල්ල ඇතුලත් වී ඇත. ස්ථාවර වත්කම් ලේඛනය හා මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් අතර යම් වෙනසක් තිබේ නම් ගිණුම් සැසඳීමේ දී අනාවරණය වේ. එහෙත් එසේ නොගැලපීමක් නොමැත. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**371 (5) | අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිමය ගිණුම් අංශය වෙත නැවත පියවිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ලබා දී තිබූ අතුරු අග්‍රිම 16 ක් පියවීමට දින 16 සිට මාස 8 දින 13 අතර කාලයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතු වීම. | නිලධාරීන් ලබාගෙන තිබූ අත්තිකාරම් මුදල් සියල්ල අදාල වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට පෙර පියවා ඇත. ඉදිරියේදී සංශෝධිත මු.රෙ. 371(5)අනුව අත්තිකාරම් ලබාගත් පසු අදාල කාර්ය අවසන්වී දින 10 ක් තුල පියවීමට කටයුතු කලයුතු බවට උපදෙස් චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 | | | |
| (i) 2.3.2. (ඇ)මාර්ගෝපදේශය | මිරිහාන රැඳවුම් මධ්‍යස්ථාන තුල රැඳවියන්ගේ ආරක්ෂාව සඳහා කඳවුර තුලසවිකිරීමට රු.899,184ක මුදලක් ගෙවාපිරිවිතර ඉදිරිපත් කිරීමකින් තොරව CCTV කැමරා පද්ධතියක්මිලදී ගෙන තිබූ අතර මිලදී ගෙන මාස 6ක් ඉක්මවීමත් සමඟ ක්‍රියාවිරහිත වී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ii) 6.1. , 6.2.2. හා 6.3.3. මාර්ගෝපදේශ | රු.5,058,663 කට ලී බඩු, කාර්යාල උපකරණ සහCCTV කැමරා මිලදී ගැනීම සම්බන්ධයෙන්මිල ගණන් ඉදිරිපත් කල යුතු කාලසීමාවක්ද අවශ්‍ය පිරිවිතර ද ඇතුලත් ලංසු කැඳවීමේ ලේඛණ සැපයුම්කරුවන් | - එම - | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙත යැවූ බව තහවුරු නොවුණි. එමෙන්ම ප්‍රසම්පාදන කමිටුව විසින්ලංසුවිවෘත කිරීමේ කමිටුවක් පත් කර නොතිබූ අතර මිල ගණන් ඉදිරිපත් කල ලේඛන තුලින් මිල ගණන් විවෘත කල දිනයන්, ලංසු විවෘත කිරීමේ කමිටුවේ දින මුද්‍රාව හා කෙටිසන් නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (iii) | 8.9.1.(ආ) මාර්ගෝපදේශය | රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කල යුතු වුවත් රු.4,829,278ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ සහ CCTV කැමරා මිලදී ගැනීම සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි. | - එම - | - එම - |
| (iv) | 8.12.3 (අ) හා (ආ) මාර්ගෝපදේශ | සපයන ලද භාණ්ඩ, පිරිවිතර සහ වෙනත් නියමයන්ට අනුකූල බව සහ සපයන ලද භාණ්ඩ ප්‍රමාණය කොන්ත්‍රාත් විධිවිධාන වලට අනුකූල බව ස්ථාන භාර නිළධාරි විසින් සහතිකයක් නිකුත් කල පසු ගෙවීම කල යුතු විය. එහෙත් එසේ සහතික කිරීමකින් තොරව ලී බඩු හා කාර්යාල උපකරණ සහ CCTV කැමරා මිලට ගැනීම වෙනුවෙන් සැපයුම්කරුවන් 5 දෙනෙක් වෙත රු.5,058,663ක මුදලක් ගෙවා තිබුණි. | - එම - | - එම - |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **ආදායම් කළමණාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා මූලික ආදායම් | ආදායම නිවැරදිව ඇස්තමේන්තු කල යුතු | විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ උපයා ගැනීමට අපේක්ෂා කළ |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුව රු.19,000,000,000ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල රැස්කරගත් ආදායම රු.14,054,129,607ක් හෙවත් මූලික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 74ක් විය. ඒ අනුව ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනස රු.4,945,870,393ක් හෙවත් සියයට 26ක් විය. | වීම. | ආදායම රු.11,000,000,000 ක් වුවත් 2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් සංචාරක පැමිණීම් සීමා වීම මත සත්‍ය වශයෙන් උපයගෙන ඇත්තේ රු.5,859,993,331කි. මේ අනුව එමගින් වූ සමස්ථ ආදායම අඩුවීම රු.5,140,006,069 ක් විය. එසේම වීසා ගාස්තු නිදහස් කිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වීසා ගාස්තු මඟින් උපයා ගැනීමට අපේක්ෂා කළ ආදායම රු.1,500,000,000 ක් වුවත් සත්‍ය වශයෙන් ලැබූ ආදායම රු.1,169,537,414 ක් විය.ඒ අනුව ආදායම් අඩුවීම රු. 330,462,586 ක් විය. |
| **(ආ)** | පුරවැසි අංශයේ පරිගණක පද්ධතිය මඟින් ලබාගත් ආදායම් වාර්තාව හා දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායම් වාර්තාවේ පුරවැසි අංශයට අදාල ආදායම් වටිනාකම් සැසඳීමේදී රු. 862,500ක වෙනසක් නිරීක්ෂණය විය. | ආදායම නිවැරදිව ගිණුම් ගත කල යුතු වීම. | ද්විත්ව පුරවැසිභාවය ඉල්ලුම් කරන ලද අයගෙන් අයවිය යුතුව තිබූ රු.57,500 ක් බැගින් වූ මුදල වෙනුවට රු.345,000 ක් බැගින් අයකිරීම හේතුවෙන් වැඩිපුර අයකරන ලද මුදල වන රු.287,500ක් බැගින් අදාළ අයට ආපසු ගෙවා ඇත. එසේ වුවද දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ ද්විත්ව පුරවැසි සහතික පත්‍ර මෙතෙක් මුද්‍රණය නොවීම හේතුවෙන් පරිගණක පද්ධතියේ අදාළ සංශෝධන සිදු වී නොමැති වුවත් සමස්ථ ආදායම් වාර්තාවේ ආපසු ගෙවීම අඩුකර නිවැරදි ආදායම ගිණුම් ගත කර ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන වැය විෂයයන් 2 ක් හා පුනරාවර්තන වැය විෂයයන්2ක් සඳහා වාර්ෂික ඇස්තමේන්තුව තුළ අධි ප්‍රතිපාදන සලසා ගැනීම මත වැය නොවී ඉතිරි වී ඇති රු.82,450,000ක් වෙනත් වැය විෂයයන් 4ක් සඳහා මාරුකර තිබුණි. | අවශ්‍යතා හඳුනාගෙන නිවැරදිව ඇස්තමේන්තු සකස් කල යුතු වීම. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී අපේක්ෂිත ප්‍රතිපාදන වාර්ෂික විසර්ජන පනතේ ප්‍රමාණවත් පරිදි අනුමත නොවීම හේතුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන් තුල වියදම් කළමනාකරණය කරමින් කලින් සැලසුම් කල නොහැකි අනපේක්ෂිත මෙන්ම අත්‍යාවශ්‍ය හා කල්දැමිය නොහැකි වියදම් දැරීම සඳහා මුදල් රෙගුලාසි මඟින් ඉඩ දී ඇති සීමාවන්ට යටත්ව මෙම ප්‍රතිපාදනයන් මාරු කිරීම් සිදු කර ඇත. |
| (ආ) | විෂයයඅංක1409 (වෙනත්) “(ETA) විද්‍යුත්සංචරණඅනුමැතියයටතේවීසාගාස්තුනිදහස්කිරීමනිසාබැංකුකොමිස්මුදල්ගෙවීමටසිදුනොවීම” යයිගිණුමේඉතිරි වීම් සඳහා හේතුදක්වාතිබුණදමෙමවැයවිෂයයෙන්රු.මිලියන 60.25 ක්හෙවත්මුල්ප්‍රතිපාදනයෙන්සියයට 27කමුදලක්වෙනත්වැයවිෂයන් 7කටමාරුකරගත්පසුවදතවදුරටත්සියයට 23ක්ඉතිරිවීතිබුණි. | - එම - | 1409 – විද්‍යුත් සංචරණ අනුමැතිය (ETA) ආදායම් ඇස්තමේන්තුවලට අනුපාතිකව බැංකු කොමිස් මුදල සඳහා ප්‍රතිපාදන සලසාගත්තද රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව විද්‍යුත් සංචරණ අනුමැතිය යටතේ අපේක්ෂිත ආදායම සියයට 46 කින් අඩු වීමහේතුවෙන් බැංකුවට ගෙවිය යුතු කොමිස් මුදල ද ඊට සාපේක්ෂව අඩුවී ඇත. |
| (ඇ) | 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2019 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වාර්ෂික ප්‍රතිපාදන වලින් සියයට 15ක් හා සියයට 10 බැගින් එකතුව සියයට 25ක් අනිවාර්යෙන් ඉතිරි කල යුතු විය. එහෙත් දෙපාර්තමේන්තුවේමූලධන වැය විෂයන් 09ක් සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.704,700,000ක් වූ අතර මුළු වියදම රු. 642,236,363ක් විය. ඒ අනුව ඉතිරිය රු.62,463,637ක් වීම හේතුවෙන් | ජාතික අයවැය චක්‍රලේඛඅනුව කටයුතු කල යුතු වීම. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 නිකුත් කරන අවස්ථාව වන විටත් 2509 මූලධන වැය විෂයෙහි හිස් ගමන් බලපත්‍ර මිලදී ගැනීම සඳහා සැලසී තිබූ රු. මිලියන 457 ක ප්‍රතිපාදනයට අතිරේකව රු. මිලියන 68.7 ක අතිරේක ප්‍රතිපාදන ද සලසා ගැනීමෙන් පසු සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය වූ |

| | | |
|---|---|---|
| ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරි කර තිබුණේ සියයට 8.8ක් පමණක් විය. | | රු.මිලියන 525.7 ක් වූ අතර ඉන් රු.මිලියන 523.8 ක් වැය කර තිබුණි. එබැවින් සමස්ථ මූලධන ප්‍රතිපාදනය වූරු.මිලියන 704.7න් , සියයට 25 ක ඉතිරිවීම් සඳහා අදාළ කරගත හැක්කේ ඉතිරි මූලධන ප්‍රතිපාදනය වූ රු.මිලියන 179ක් පමණි. ඉන් සියයට 25 ක මුදල වන රු.මිලියන 44.75 ක් ඉතිරි කලයුතු වුවත් රු.මිලියන 62.4 ක් (සියයට 34.8) ඉතිරි කර අයවැය චක්‍රලේඛයට අනුව කටයුතු කර ඇත. අමාත්‍යාංශය මේ පිළිබඳව දැනුවත් කර ඇත. |

**2.3** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) 2019 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කරන ලද රු. 8,177,478ක බැරකම්, බැදීම් හා බැරකම් පිළිබද ප්‍රකාශය සටහන අංක iiiහා iv හි දක්වා නොතිබුණි. | සියලු බැරකම්, බැරකම් ප්‍රකාශයේ සටහන් කල යුතු වීම. | අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාව වන විටත් ඉදිරිපත් වී නොතිබූ බැවින් බැරකම් ලෙස ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. එහෙත් පසුව ගෙවීමට ඉදිරිපත් වූ ගෙවීම් මෙහි ඇතුළත්ව ඇත. |
| (ආ) 2017 වර්ෂයේ සිට වාර්ෂික විසර්ජන පනත මගින් සලසා දෙනු ලබන ප්‍රතිපාදන ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීම හා අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම් වලට එළඹීම වළක්වාලීමේ අරමුණින් නිකුත් කර ඇති 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 1 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඒ අනුව අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා රු.26,367,692ක | අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් හා බැරකම් වලට නොඑළඹියයුතු වීම. | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන - 03) අනුව දක්වා ඇත්තේ මු.රෙ. 94(1) අනුව ප්‍රතිපාදන සීමාවන් තුළ ඇති කර ගන්නා ලද බැරකම් ලැයිස්තුව වේ. ඒ අනුව 1101 වැය විෂය හැර අනෙක් බැරකම් වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා නොමැත. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකමකට බැඳීම් හා බැරකම්වලට එළඹ තිබුණි. | | |
| (ඈ) | ඉහත (ආ) ඡේදයෙහි සඳහන් චක්‍රලේඛයේ (ඇ) ඡේදය ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාල සියලුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළයුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතු බවට උපදෙස් ලබාදී තිබුණි. එහෙත් රු.488,132 ක බැරකම් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු නොකර 2020 වර්ෂයට ගෙන ගොස් තිබුණි. | කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළ නිරවුල් කිරීමේ අරමුණ ඇතිව කටයුතු නොකල යුතු වීම. | මු.රෙ. 94(2) අනුව 2019 වර්ෂයේ ගෙවීමට ඉදිරිපත් නොවූ එහෙත් බැරකමක් වශයෙන් හඳුනාගත් ගෙවීම් 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට බැරකමක් වශයෙන් ඉදිරියට ගෙන ගොස් ඇත. මින් රු. 367,422/- ක බිල්පත් මෙතෙක් ගෙවීමට ඉදිරිපත් වී නොමැති බැවින් වවුචර් විගණනයට ඉදිරිපත් කළ නොහැකිව ඇත. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඇප තැන්පත් ගිණුමේ වර්ෂ 2 ඉක්මවූ රු.75,000ක ඇප තැන්පතු සම්බන්ධව මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර එකී ගිණුම් අළුත් කිරීමක්ද කර නොතිබුණි. | ගිණුම අළුත් කිරීමට කටයුතු කල යුතු වීම. | ආරක්ෂණ ඇප තැන්පත් මුදල් නිදහස් කිරීමට අදාළ රික්විසිෂන් පත් හා මුදල් තැන්පත් ලදුපත් ඉදිරිපත් කරන ලෙස අදාළ ආයතන වෙත දැනුම් දුන්නද ඒවා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අදාළ නිරවුල් කිරීම් සිදු කිරීමට නොහැකි වී ඇත. කෙසේ වෙතත් 2020 වර්ෂයේ ගිවිසුම් ගත වීමේදී මෙය නිරවුල් කිරීමට කටයුතු යොදනු ඇත. |

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිලධාරීන්6 දෙනෙකුගෙන් අයවිය යුතු වසර දෙකකට වැඩි වූ රු.386,950ක ණයශේෂ මෙතෙක් නිරවුල් කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. | මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකරගැනීමටත්,වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් නීති අංශය වෙත දැන්වීමටත් කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආයතනයක ඉදිරි වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව තුන් අවුරුදු මධ්‍යකාලීන අයවැය රාමුව තුල නියමිත මුදල් වර්ෂයට අදාලව සැකසිය යුතු වුවත් 2019 වර්ෂය සඳහා සාදන ලද ක්‍රියාකාරී සැලැස්ම 2019 වර්ෂයේ අවස්ථා 6කදී සංශෝධනය කර තිබුණි. | ක්‍රියාකාරී සැලැස්මප්‍රායෝගිකව ක්‍රියාත්මක කළහැකි පරිදි සකස් කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

### 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වීසා අංශයේ පාලක නේපාලයේ පැවැත්වෙන සමුළුවකට සහභාගි වීමට යාම සඳහා රු. 105,000 කට Hemas Travel (Pvt) Ltd වෙතින් ගුවන් ටිකට්පත ලබාගෙන තිබුණි.මිල ගණන් ඉදිරිපත් කර තිබු ආයතන තුනෙන් Hemas Travel (Pvt) Ltd ආයතනයේ පමණක් දිනය හා නම සඳහන්ව තිබු අතර අනෙක් ආයතන දෙකෙහි නම සඳහන්ව නොතිබුණි. | චක්‍රලේඛය අනුව තරඟකාරී මිල ගණන් කැඳවා නිවැරදිව සැපැයුම්කරුවෙකු තෝරා ගත යුතු වීම. | මේ යටතේ ඉදිරිපත් කර ඇති ගුවන් ටිකට්පත් මිළදී ගැනීමට අදාළව විගණන විමසුමේදී නිරීක්ෂණය වී ඇති වැරදි සහ අඩුපාඩු නිවැරදි කරගනිමින් , ඉදිරියේදී නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුව ගුවන් ටිකට්පත් සඳහා මිළ කැඳවීමටත් ඒ අනුව ගුවන් ටිකට්පත් සඳහා ගෙවීම් කිරීමටත් කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) බ්‍රසීලය, ප්‍රංශය, නේපාලය, තායිලන්තය සහ එංගලන්තය යන රටවල පැවැත්වූ සම්මේලනවලට, සහභාගි වීමට රු. 2,141,000 ක් වටිනාකමැති ගුවන් ටිකට්පත් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව එක් ආයතනයකින් පමණක් මිලදීගෙන තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා බණ්ඩාරනායක ගුවන් තොටුපල අතර දත්ත රැහැනක් එළීම ( Laying CAT 6a Data Cabling ) පිළිබඳ ප්‍රසම්පාදනයේදී නිසිලෙස දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු රැස්වීමකින් අනුමැතිය ලබා දීමටපෙර රු. 1,203,300කට ප්‍රසම්පාදනය පිරිනැමීමේ ලිපිය නිකුත් කර තිබීම තුලින් එම කාර්ය විධිමත්ව සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය නිවැරදිව සිදු කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි |

**3.3 පාඩු හා හානි**

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 10 සිට 19 දක්වා තායිලන්තයේ සහ එංගලන්තයේ පැවැත්වෙන SITA සමුළුව සහ ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් නොවන පුද්ගලයකු වෙනුවෙන් BOC Travels වෙත රු.251,000ක් ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පමණක් ගෙවීම් කල යුතු වීම. | අංක 17/2628/7491023/DNTDI දරණ කැබිනට් අනුමැතිය අනුව SITA i boarder ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති තාක්ෂණික පිරිවිතර පරික්ෂා කර බැලීමටත් ඒ අනුව තාක්ෂණික වාර්තාවක් අප දෙපාර්තමේන්තුව වෙත ලබා දීමටත් ඇති නිසා 2018/12/15 සිට 2018/12/ දක්වා එක්සත් 19 යේරාජධානියේ අදාළ ආයත තාක්ෂණික පද්ධතිය එම ආයතනය හා එකඟ වූ පරිදි නිරීක්ෂණයක් සඳහා තාක්ෂණික පිරිවිතර හා අවශ්‍යතා පිළිබඳ මනා අවබෝධයක් ඇති අයකු ඒ සඳහා සහභාගී විය යුතු විය. එම නිසා තොරතුරු තාක්ෂණ උපදේශකයකු සහභාගී කරවාගෙන ඇති බැවින් ඔහුට ගුවන් ගමන් ටිකට්පත් සඳහා ගෙවා ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නියමිත කාලයේදී භාවිතා නොකිරීම නිසා ගබඩාවේ ගබඩා කර තිබූ රු.6,472,571 ක් වටිනාකමැති හිස් විදේශ ගමන් බලපත්‍ර වර්ග 07 ක් අපහරනය කිරීම නිසා පාඩුවක් සිදුවී තිබූ අතර රු.3,889,685 ක් වටිනාකමැති හිස් විදේශ ගමන් බලපත්‍ර වර්ග 04 ක් වර්ෂ 15 ක පමණ කාලයක සිට භාවිතයෙන් ඉවත් කර තිබුණි. | රජයේ මුදල් නාස්ති නොවන ආකාරයට භාවිතා කල යුතු වීම | ඉන්දියාවේ සරණාගත කඳවුරුවල වෙසෙන පුද්ගලයින්ට එක්වතාවක් පමණක් ලංකාවටපැමිණීම සඳහා මෙම බලපත්‍ර තොගය භාවිතා කිරීමට |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන දෙකක් අපහරණය කිරීමට අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් 2019 ඔක්තෝබර් 02 දින අනුමැතිය ලබා දුන්නද 2019 වර්ෂයේ සිට ධාවනයේ යොදවා නොතිබූ මෙම වාහන දෙක සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපහරණය කිරීමටකටයුතු කර නොතිබුණි. | නියමිත අපහරණ ක්‍රියාවලිය සිදු කල යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය එනම් මෘදුකාංග හා ආශ්‍රිත දත්ත සහ ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය, වීසා සැකසීම, | පරිගණක පද්ධතිය ඇසුරින් | විදේශ දූත මණ්ඩල ශාඛාව සඳහා 2018 ජනවාරි 01 සිට 2019 ජුනි 30 දක්වා ලැබුණු ගමන් බලපත්‍ර ඉල්ලුම්පත් සංඛ්‍යාව සහ |

| | | | |
|---|---|---|---|
| | ගමන් බලපත්‍ර පද්ධතිය, පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය යනාදී පද්ධති සඳහා Informatic International (Pvt) Ltd ආයතනය සමඟ 2003 ජුනි 16 දින පටන් ගිවිසුමට එළඹ තිබුණි. එදින සිට2019 වර්ෂය දක්වා රු.135,154,160 ක් එම ආයතනයට ගෙවා තිබුණු අතර මෙතරම් මුදලක් වැය කරමින් නඩත්තු කරන පරිගණක පද්ධතිය තුලින් ගමන් බලපත්‍ර ලේඛණගත කිරීම, ගමන් බලපත්‍ර නිකුත් කිරීම් හා පරිගණකගත කිරීම් අතර වෙනස්කම් හඳුනා ගැනීම සඳහා වාර්තා ලබා දිය නොහැකි බව වාර්තා වීතිබුණි. | අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කටයුතු සැලසිය යුතු වීම. | නිකුත් කරන ලද ගමන් බලපත්‍ර සංඛ්‍යාව එම ලිපියේ ඇමුණුම පරිදි ලබා දෙන මෙන් ඉල්ලුම් කර ඇත. 2018 ජනවාරි 01 සිට 2019 ජුනි 30 දක්වා මෙම අංශය විසින් ගමන් බලපත්‍ර 72,768ක ප්‍රමාණයක් නිකුත් කර ඇත. ඔබ විසින් එවනු ලැබූ ආකෘතිය ප්‍රකාරව ගමන් බලපත්‍ර 72,768ක ප්‍රමාණයක තොරතුරු ලබාගත යුත්තේ පරිගණක දත්ත පද්ධතිය ආශ්‍රයෙන් හා එම තොරතුරු ඔබ විසින් ඉල්ලුම් කල ආකෘතියට අදාල තොරතුරු දත්ත පද්ධතිය මඟින් එක් එක් අංශ වලට ලබා ගැනීමට අවශ්‍ය ප්‍රවේශය මේ වන තෙක් සැකසී නොමැත. |
| (ආ) | 2003 ජුනි 16 දින පටන් Informatic International Ltd ආයතනය සමඟ එළඹ තිබූ ගිවිසුම් ඒ ආකාරයෙන්ම වර්ෂ 16 ක් දක්වා පවත්වාගෙන යන අතර ගිවිසුම අළුත් කිරීමේදී දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම් කාලය අවසන් වී මාස දෙකේ සිට තුන දක්වා කාලයකට පසුව මෙම ආයතනය සපයන සේවා සම්බන්ධව දෙපාර්තමේන්තුව සෑහීමකට පත්වන බව දෙපාර්තමේන්තුවේ පාලක (තොරතුරු තාක්ෂණ) විසින් වාර්තා කරනු ලබයි. ඒ අනුව වාර්ෂිකව ගිවිසුම අලුත් කරනු ලැබේ.2017සිට 2019 දක්වා කාලය තුල හිඟ සේවා ගාස්තු ලෙස රු. 9,800,000ක මුදලක්වරින් වර අලුත් කරන අවස්ථාවලදී මාසික ගාස්තුවට එකතු කර ගෙවා තිබුණි. | ගිවිසුම් ගත කාලය සඳහා පමණක් ගාස්තු ගෙවිය යුතු වීම. | ගිවිසුම් ඉදිරිපත් කිරීමේදී හා ලිපි කටයුතු හුවමාරුවේදී සිදුවන ප්‍රමාදවීම් නිසා මෙවැනි තත්ත්වයක් ඇති වූ අතර, දැනට එම ගිවිසුම් යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ කමිටුවක්ද පත්කර ඇත. එම කමිටුවේ අධීක්ෂණය යටතේ මේ වන විට සියළුම ගිවිසුම් වල තොරතුරු ඇතුළත් උපලේඛණයක් සකස් කර ඇති අතර එමගින් කාලසීමාව ඉකුත් වීමට පෙර ගිවිසුම් යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා කටයුතු යොදා ඇත. එබැවින් ඉදිරියේදී ඉහත කී අතපසුවීම් වලක්වා ගැනීමට හැකිවන බවද දන්වමි. |
| (ඇ) | විදේශ දූත මණ්ඩල අංශය විසින් නව ගමන් බලපත්‍රයක් අයදුම් කිරීමේදී ඉදිරිපත් කලයුතු ලිපි ලේඛණ පිලිබඳව ගමන් බලපත් අංශය විසින් 2019 වර්ෂයට අදාලව නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොත් 9.1.7 ඡේදයේ සඳහන් කර තිබුණි. ඒ අනුව 6, 8 හා 12ඡේද ප්‍රකාර ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා අයදුම්කරුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපතේඡායා පිටපතක්,ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්, මුදල් ගෙවන ලද ලදුපතේ ඡායා පිටපතක් හා වෙනත් දේඅවශ්‍ය වුවත් එකී සහතික ඉදිරිපත් කිරීමකින් තොරව ගමන් | මෙහෙයුම් අත්පොතෙහි උපදෙස් අනුව කටයුතු කල යුතු වීම. | ගමන් බලපත්‍රයේ තොරතුරු හා අපගේ දත්ත පද්ධතියේ සඳහන් තොරතුරු හා සසඳා බලනු ලැබේ. ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා නියෝග ලබා දෙනු ලබන සහකාර පාලක හෝ නියෝජ්‍ය පාලක ගමන් බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් සෑහීමකට පත්වීමෙන් පසුව ගමන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා නියෝග ලබා දෙනු ලබයි. ගමන් බලපත්‍රය අස්ථානගත වූ අවස්ථාවන් වලදී එම ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක් අයදුම්පත්‍රය සමඟ එවා නොමැති අයදුම්කරුවන්ගෙන් පමණක් උප්පැන්න සහතිකය හා හැඳුනුම්පත |

| | | | |
|---|---|---|---|
| | බලපත්‍ර නිකුත් කර තිබු අවස්ථා 72 ක් නිරීක්ෂණය විය. | | තිබේනම් හැඳුනුම්පතෙහි පිටපතක් අනිවාර්යයෙන් ලබා ගැනීමෙන් අනතුරුව ගමන් බලපත්‍රය නිකුත් කරනු ලබයි. |
| (ඈ) | දෙපාර්තමේන්තුවේ විදේශදූතමණ්ඩලඅංශයෙන්සමාලෝචිතවර්ෂයේගමන්බලපත්‍රනිකුත්කිරීමේදීලැබුණුආදායමවෙනමහඳුනාගතනොහැකිවූබැවින්එමගමන්බලපත්‍රනිකුත්කිරීමටඅදාලආදායමසත්‍යවශයෙන්මලැබුණේදයන්නතහවුරුකරගතනොහැකිවුණි. වාර්ෂිකවරු.මිලියන 8.4වැයකරනඩත්තුකරනපරිගණකපද්ධතිය තුලින්දමෙයතහවුරුකරගතනොහැකිවිය. | විදේශදූතමණ්ඩලඅංශයෙන්නිකුත් කරන ගමන්බලපත්‍ර ආදායමවෙන මහඳුනාගත හැකි ක්‍රමයක් හඳුන්වා දිය යුතු වීම. | 2018 ජනවාරි 01 සිට 2019 ජුනි 30 දක්වා මෙම අංශය විසින් ගමන් බලපත්‍ර 72,768 ක ප්‍රමාණයක් නිකුත් කර ඇත. ඔබ විසින් එවනු ලැබූ ආකෘතිය ප්‍රකාරව ගමන් බලපත්‍ර 72,768 ක ප්‍රමාණයක තොරතුරු ලබා ගත යුත්තේ පරිගණක පද්ධතිය තුලින් බැවින් හා එම තොරතුරු ඔබ විසින් ඉල්ලුම් කළ ආකෘතියට අදාළ තොරතුරු දත්ත පද්ධතිය මඟින් එක් එක් අංශවලට ලබා ගැනීමට අවශ්‍ය ප්‍රවේශය මේ වන තෙක් සැකසී නොමැත. එම නිසා විගණයෙන් ඉල්ලුම් කරන ලද හා මෙම දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය මඟින් ලබාගත හැකි තොරතුරු සහකාර පාලක (තොරතුරු තාක්ෂණ) විසින් සහතික කර ඉහත ලිපිය ප්‍රකාරව විගණන අධිකාරි වෙත ලබා දී ඇත. |
| (ඉ) | නියදි පදනම මත විදේශ දූත මණ්ඩල හරහා ලැබෙන ගමන් බලපත්‍ර 54 ක් පරීක්ෂාවේදීඑකී බලපත්‍ර නිකුත් කිරීමට දින 10 සිට දින 74 දක්වා කාල පරාසයක් ගත කර තිබුණි. | ප්‍රමාදයකින් තොරව ගමන් බලපත්‍ර නිකුත් කල යුතු වීම. | පරිගණක පද්ධතියේ රෙජිස්ටර් කරන ලද අයදුම්පත් ACCEPT කර ගමන් බලපත්‍ර විවිධ පියවරයන් යටතේ සැකසී අදාළ තානාපති කාර්යාල වෙත යවා ඇත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------------------- |
| (අ) | තායිලන්තයේ පැවති අධ්‍යයන චාරිකාවක් සඳහා ගමන් බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියෙහි වගකීම් පැවරී ඇති නිලධාරීන් පස් දෙනෙකු නම් කරන ලෙස දන්වා තිබුණි. එහෙත් ඒ සඳහා සහභාගී වී තිබුණේ ගමන් බලපත් සහායක, සංවර්ධන නිලධාරි සහ පරිගණක දත්ත ක්‍රියාකරු (සංවිධාන සටහන අනුව නොමැති තනතුරකි ) යන තනතුරු දරණ නිලධාරීන් විය. | ගමන් බලපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියෙහි වගකීම් පැවරී ඇති නිලධාරීන්පමණක් නම් කිරීමට කටයුතු කල යුතු වීම. | ගමන් බලපත් සැකසීමේ කාර්යයේ දී එම කාර්යයන් පරිගණක මෘදුකාංගයක් හරහා මොඩියුලයක් ලෙස ක්‍රියාත්මක කිරීම හේතුවෙන්සංවර්ධන නිලධාරි සහඑම පරිගණක , පද්ධතිය පිලිබඳ කටයුතු කරන ලද ගමන් බලපත් සහායක, එවකට සිටි පාලක |

| | | | |
|---|---|---|---|
| | | | ජනරාල්වරයා විසින් සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය මඟින් සංවිධානය කරන ලද අධ්‍යයන චාරිකාව සඳහා නම් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | සේවා අවශ්‍යතාව සලකා බලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ Dms/1177/vol-1 අංකදරණ 2017 නොවැම්බර් 24 දිනැතිලිපියමඟින්විවේකාගාරසහායකතනතුරු 6ක්අනුමතකරතිබුණදසමාලෝචිතවර්ෂයදක්වාඑකී පුරප්පාඩුපුරවානොතිබීමෙන්දෙපාර්තමේන්තුවේකා ර්යසාධනය කෙරෙහි මෙම තනතුර අවශ්‍ය වන්නේද යන්න ගැටළු සහගත විය. | අවශ්‍යතාවය සොයා බලා කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවිය යුතු වීම. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) | බලයලත් නිලධාරීන්ගේ රාජකාරි කටයුතුවලට සහායවීම පිණිස දෙපාර්තමේන්තුගත සේවයක් ලෙස මෙහෙයුම් සහකාර තනතුරු 50ක් 2018 වර්ෂයේ සහ 2019 වර්ෂයේ තවත් තනතුරු 50ක් ලෙස තනතුරු 100ක් සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ Dms/1183 දරණ 2017 ජූලි 05 දිනැති ලිපිය මඟින් අනුමැතිය ලැබී තිබුණද 2017 වර්ෂයේ සිටසමාලෝචිත වර්ෂය දක්වාම එකී පුරප්පාඩු පුරවා නොතිබුණි. | - එම - | - එම - |